# ආනාථ නිවාසවල දරුවන්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සුදුසු පුස්තකාල ආකෘතියක් ගොඩනැංවීම.

(කෑගල්ල, කොළඹ, කුරුණෑගල දිස්ත්‍රික්කඇසුරිනි.)

එස්.එම්.අවලශාන්ති කරුණාරත්න

FGS/LISC/MC/2008/08



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1195 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී

2014 දෙසැම්බර්

# ABSTRACT

The present day children have to be cared and protected as they are the men and the women of the future. The children and the young need information for their well – being. Children living in children's homes too need vital information for their well-being. The age limit of the child varies from country to country. But those under the age of 18 are considered as children. The number of disabled and house bound children is growing rapidly specially in developing countries like Sri Lanka. These children are abandoned by their parents or their both parents are dead and they fell in to the category of orphans. The objective of this research is to investigate the present status of library services in the children's home in Sri Lanka and to make recommendation for the improvement of library services. However the research is limited to three districts namely Colombo, Kegalle and Kurunegala. The methodology of the research is by collecting data through questionnaires, interviews, observation and by referring to reports available. The data thus collected have been analyzed by using the Statistical Package for Social Sciences (SPSS). The result has been vividly shown with the use of graphs and diagram.

In conclusion several suggestions have been made for the improvement of library services in children's home and for the upliftment of their reading habits. It is very necessary to promote the reading habits of children motivating them to read, not only the department of probation and child care but also the social services department must conduct periodical checks on children's homes, proper standards should be maintained in children's homes, to provide training programs for wardens and other officers in charge of children's homes and to improve libraries in children's homes by automating the services of the library.

Key Words:

- Orphanage
- National Library
- Information Needs
- Library Model
- Children's Library

# නිබන්ධ සාරාංශය

හෙට දවසේ අනාගතය භාරගැනීමට සිටින පිරිස වශයෙන් අද දවසේ කුඩා වයසේ පසුවන දරුවන් දැඩි අවධානයක් යොමුකොට ආරක්ෂා කිරීම සිදු කළ යුත්තකි. දරුවන්ගේ මෙන්ම තරුණ පරපුරෙහි යහ පැවැත්මට තොරතුරු අත්‍යාවශ්‍ය අංගයකි. ළමා නිවාසයන්හි නිවැසි ළමුන්ගේද යහපැවැත්මට සත්‍යතොරතුරු වල අවශ්‍යතාවය වෙනසක් නොමැත. ළමයා යන්න අර්ථ නිරූපණයේදී වයස් සීමාවන් රටින් රටට වෙනස්වේ. කෙසේ වුවද, වයස අවුරුදු 18 න් පහළ වයස් කාණ්ඩයේ පසුවන ඕනෑම පුද්ගලයෙකු ළමයකු ලෙෂ පිළිගැනේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටවල ආබාධිත මෙන්ම නිවාසගත ළමා පිරිස වේගයෙන් ඉහළ යමින් පවතී. මොවුහු සිය දෙමාපියන් විසින් ස්ථීර වශයෙන්ම අතහැර දැමීම හෝ දෙමාපියන් මියයාම හේතුවෙන් අනාථ තත්ත්වයට පත්වූවෝ වෙති. ශ්‍රී ලංකාවේ ළමා නිවාසයන්හි වර්තමාන පුස්තකාල පහසුකම් හඳුනාගැනීම මෙන්ම ළමා නිවාසයන්හි නිසි පුස්තකාල පහසුකම් ඇතිකිරීම උදෙසා සුදුසු යෝජනාවන් ඉදිරිපත්කිරීම මෙම පර්යේෂණ කාර්යයෙහි මූලික අරමුණවේ. කෙසේවුවද, පර්යේෂණය කෑගල්ල, කොළඹ, කුරුණෑගල යන දිස්ත්‍රික්ක ත්‍රිත්වයට සීමාවේ. ප්‍රශ්නාවලි යොමුකිරීම මගින් පර්යේෂණ කාර්යයට මූලිකවම දත්ත ලබාගන්නට යෙදුන අතර සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණයන් හා විවිධ වාර්තා ඒ සඳහා මහෝපකාරී විය. එලෙස ලබාගත් දත්තයන් SPSS (Statistical Package for Social Sciences)වෙත යොමුකර හෙළිකරගත් කරුණු ගණනාවකි. එම තොරතුරු ප්‍රස්තාර හා සංඛ්‍යා වගු හරහා තවදුරටත් පැහැදිලිකොට තිබේ.

අවසන් වශයෙන් ළමා නිවාස පුස්තකාල සේවාවන් ප්‍රවර්ධනයට මෙන්ම ඔවුන්ගේ කියවීමේ පුරුදු නංවාලීම උදෙසා යම්යම් නිගමන ඉදිරිපත් කිරීම සිදුවේ.

ළමුන්ගේ කියවීමේ පුරුදු වර්ධනය උදෙසා ඔවුන් අභිප්‍රේරණය කිරීම, පරිවාස හා ළමාරක්ෂක අධිකාරිය පමණක් නොව, සමාජ සේවා දෙපාර්තමේන්තුව කලින්කලට ළමා නිවාසයන් අධීක්ෂණය කිරීම, ළමා නිවාසයන්හි නිසි ප්‍රමිති ක්‍රියාත්මක කිරීම, ළමා නිවාස පාලිකාවන් උදෙසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ළමා නිවාස පුස්තකාලයන් තුළ සේවා ස්වයංක්‍රියකරණය මගින් පුස්තකාල සේවා වැඩිදියුණු කිරීම යනාදිය අත්‍යවශ්‍යයෙන්ම සිදුකළ යුත්තකි.

**ප්‍රමුඛපද :**

- අනාථ නිවාස
- ජාතික පුස්තකාලය
- තොරතුරු අවශ්‍යතා
- පුස්තකාල ආකෘති
- ළමා පුස්තකාල